# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,133 — 1960 මැයි 20 වැනි සිකුරාදා — 20.5.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... — — | 343 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .... ... | 347 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 349 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම — — | 360 | විවිධ දැන්වීම් — — — | — |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීහු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් සෑම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iii) සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන තෙබසින් එක් බසක් කියවීමේ හා ලිවීමේ හැකියාවක්, හා

(iv) නොකිළිටි රිය පැදවීමේ ප්‍රවීනතා සහතික පත්‍රයක් ද තමා සතුව ඇත යන වගට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

**සැළකිය යුතුයි.**—මෝටර්රථ යාන්ත්‍රික විද්‍යාව ගැන දැනීමක් හා සෑම තරාතිරමකම මොටෝ රථ පැදවීමේ බලය පැවරෙන අනුමැති සටහනක් සහිත රිය පැදවීමේ ප්‍රවිනතා සහතික පත්‍රයක් ද තමන් සතුව ඇති ඉල්ලුම්කරුවනට වැඩි සැළකිලි දක්වනු ලැබේ.

4. **වෙනත් සුදුසුකම්.**—ඉල්ලුම්කරුවන් අවිවාහකයන් විය යුතු ය. සේවා මුක්ත භටයන්ට හා ලංකාවේ ඒකාබද්ධ රාජ්‍ය සතු කඳවුරු වල සේවයෙන් අස්කොට සිටින සේවකයන්ට මෙය අදාල නොවේ.

5. **වෛද්‍ය පරීක්‍ෂණය.**—තෝරා ගත් සෑම අපේක්‍ෂකයකුම, පත් වීම් ලබන්නට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම අවශ්‍ය වේ. රිය පැදවීමේ දක්‍ෂතාවය පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන්ගේ හැසිරීමට බාධාවන යම්කිසි අංග විකලත්වය කින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙලෙන කිසිම අපේක්‍ෂකය කුට ඔහු ලංකාවේ කවර පෙදෙසක වුව ද සේවය කිරීමට සුදුසු බවට සහතික කොට තිබුණත්, පත්වීමක් දෙනු නොලැබේ.

6. **පුහුණුවීමේ කාලය.**—රියැදුරෙකුගේ පුහුණුවීමේ කාලය සති පහක් වෙයි. මෙම කාලය අවසානයෙහි දී ඔහු (අ) රිය පැදවීම (ආ) මාර්ග නීති සංග්‍රහය, හා (ඇ) මොටෝ යාන්ත්‍රික විද්‍යාව (ප්‍රායෝගික හා න්‍යායයික) යන කරුණු වලින් සමන්විත පරීක්‍ෂණයකින් සමත් වීම අවශ්‍ය වේ.

7. **බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල හා එවැනි වෙනත් දෙපාතීමේන්තු අරමුදල් වලට දායක වීම අවශ්‍ය වේ.

8. **සේවා කොන්දේසි:—**

(අ) සෑම පත්වීම් ලබන්නෙකුම, තුන් අවුරුදු ආධුනික කාලයක් සේවය කිරීම අවශ්‍ය වේ.

(ආ) ඔවුන් සේවයෙහි ස්ථිර කරන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

(ඇ) පත්වීම් ලබන්නෝ පොලිස් විනය නීති සංග්‍රහයට හා වෙනත් දෙපාර්තමේන්තු නීතිරීති ආදියට ද යටත් විය යුත්තා හ.

9. ඉල්ලුම්කරුවන් සිය ඉල්ලුම් පත් වලට—.

(i) උප්පැන්න සහතිකය

(ii) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්

(iii) රිය පැදවීමේ ප්‍රවීනතා සහතිකපත්‍රය යන මේවායින් පිටපත් අමුණා එවිය යුතු වේ.

10. මෙම ගැසට් පත්‍රයෙහි, I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයෙහි එන රජයේ සේවයේ පත්වීම් වම්බන්ධයෙන් බල පැවැත්වෙන පොදු කොන්දේසි වලට ද අවධානය යොමු කරනු ලැබේ.

11. පත්වීම් ලබන්නවුනට—

(අ) නොමිලයේ නිවාස

(ආ) නොමිලයේ නිල ඇඳුම්, හා

(ඇ) ඇඳුම් කට්ටල පෙට්ටියක්, පලසක්, පාවහන් හා ඔප නැඟීමේ ද්‍රව්‍ය පහසුකම් සපයනු ලැබේ.

12. දැනට රජයේ සේවයේ යෙදී සිටින්නවුන්ගේ ඉල්ලුම් පත්, ඔවුනොවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතු ය.

මො. වි. ඡේපා. අබයකෝන්,
පොලිස් පති.

1960 මැයි මස 16 වැනි දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේ දීය.

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

**දෙවන ශ්‍රේණියේ ජනපද නිලධාරි හා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් කච්චි පරිපාලක ශ්‍රේණීන් සඳහා පුහුනුවන්නෝ**

දෙවන ශ්‍රේණියේ ජනපද නිලධාරීන් හා ඉඩම් සංවර්ධන ආඥා පණත යටතේ ඉඩම් කච්චි පරිපාලකවරුන් වශයෙන් පුහුණුවන් නන් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් හා පත් කිරීමේ කොන්දේසි:—**

පුහුණු වන්නන්ගේ තනතුරු තාවකාලිකය. සියලු දීමනා ඇතුළත් රු. 100 ක උප වේතනයක් පුහුණුව ලබන කාලයේදී ගෙවනු ලැබේ. නේවාසික පහසුකම් රජයෙන් සැපයේ නම් මෙම උප වේතනයෙන් රු. 75 ක් ඒ සඳහා අය කරනු ලැබේ.

පුහුණු කරවීමට තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින්, පේරාදෙණියේ බාලක කෘෂිකම් විද්‍යාලයෙහි හෝ, අම්පාරේ, ගල්ඔය සංවර්ධන ව්‍යාපාරයේ කාර්මික ශිල්පායතනයෙහි හෝ දෙවසක පාඨමාලාවක් හැදෑරිය යුතුය. දෙවස පුහුණුවන කාලය අවසානයෙහි කෘෂිකම් විද්‍යාලයෙහි ජ්‍යෙෂ්ඨ සහතික හෝ කාර්මික ශිල්පායතනයෙහි ඩිප්ලෝමා උපාධිය හෝ ලබාගත යුතුය.

එසේ ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ ඩිප්ලෝමා උපාධිය ලබාගත් පුහුණුවන්නන් දෙවන ශ්‍රේණියේ ජනපද නිලධාරීන් වශයෙන් හෝ ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ ඉඩම් කච්චි පරිපාලකවරුන් වශයෙන් හෝ පත් කරණු ලැබේ. මේ ශ්‍රෙණීන් දෙකටම පහත සඳහන් වාර්ෂික වැටුප් ක්‍රමය යටතේ ගෙවනු ලැබේ:—

රු. 1,380—20×120—රු. 3,780.

දෙවන ශ්‍රේණියේ ජනපද නිලධාරීහු අවුරුදු 10 ක සේවා කාලයකින් පසු 1 වන ශ්‍රේණියට උසස් වීමට සුදුසු වෙති. 1 වන ශ්‍රෙණියේ ජනපද නිලධාරීන්ගේ වාර්ෂික වැටුප් ක්‍රමය පහත සඳහන් වේ:—

රු. 3,180—6×120, 8×180 හා 2×240—රු. 5,820

3. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්:—**

පුහුණු වන්නන් වශයෙන් පත්වීම අපේක්‍ෂා කරන අයදුම්කරුවන් වයස අවුරුදු 17 ට නොඅඩු හා අවුරුදු 23 ට නොවැඩි අය විය යුතුය. මේ වයස සීමාව දැනට රජයේ සේවයෙහි නියුක්තවූවන්ට අදාල නො වේ.

සෑම අයදුම්කරුවකුම—

(අ) රසායන විද්‍යාව විශයක් වශයෙන්, ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය සමත්ව සිටිය යුතුය.

(ආ) තෘණ විද්‍යාව ගැන දැනීම අමතර සුදුසුකමක් වශයෙන් සැලකේ.

4. **සේවා කොන්දේසි:—**

දෙවන ශ්‍රේණියේ ජනපද නිලධාරි හා ඉඩම් සංවර්ධන ආඥා පණත යටතේ ඉඩම් කච්චි පරිපාලක තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ඒවා ය. පත්වීම අවුරුදු 3 ක ආධුනික පරීක්ෂණ කාලයකින් යුක්තය.

(අ) තෝරාගනු ලැබූ ආධුනිකයයින්, මව හෝ පියා හෝ භාරකාරයෙකු ප්‍රධාන ගිවිසුම්කරු වශයෙන් හා ඇපකරුවන් දෙදෙනෙකුත් ඇතිව රු. 3,000 ක පොරොන්දු පත්‍රයක් අත්සන් කළ යුතුය. එහි ළවමනාවන් නිසි අයුරු ඉටු කිරීමටත්, විශ්වාස කටයුතුව හා උද්‍යොගිමත්ව පාඨමාලාව හැදෑරීමටත් ජනපද නිලධාරියෙකු හෝ ඉඩම් කච්චි පරිපාලකයෙකු වශයෙන් හෝ, එසේ ළවමනා වී නම් පත්වූ දින සිට යටත් පිරිසෙයින් අවුරුදු 5 ක කාලයක් රජයට සේවය කිරීම ඊත් පොරොන්දුව ගිවිසුම් පතටද ඇතුළත් විය යුතුය.

(ආ) ලංකාවේ කවර පෙදෙසක වුවද සේවය කිරීමට සුදුසු ද යන වග පරීක්‍ෂා කිරීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට සෑම පත්වන්නකුම පෙනී සිටිය යුතුය. සෑම පත්වන්නකුම ලංකාවේ ඕනෑම පළාතක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

(ඇ) සෑම පත්වන්නකුම රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වස් වෙසෙසින්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද එකඟව ක්‍රියා කළ යුතුය.

(ඈ) ඉහත සඳහන් ශ්‍රේණීන් දෙකින් කවරකට වුවද පත්වන ආධුනිකයින්—

1. රාජකාරි කටයුතු සඳහා මෝටර් බයිසිකලයක් වැනි අනුමත කරන ලද වාහනයක් තබාගත යුතුය.
2. ස්ථාවර ලේකම් තැන අනුමත කරන අයුරු රු. 1,500 ක ඇපයක් තැබිය යුතුය.

5. සෑම අයදුම් පතක්ම මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක පිටපත් සමග එවිය යුතුය.

6. පහත දැක්වෙන අන්දමට පිළියෙල කරගත් ඉල්ලුම් පත් අයදුම්කරුවන් විසින් "ඉඩම් කොමසාරිස් තැන, තැ. පෙ. 500, කොළඹ 1." යන ලිපිනයට 60. 6. 4. දිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන්නට ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. **පහත දැක්වෙන අන්දමට පිළියෙල නොකරන ලද අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

7. අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

එච්. සී. ගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්.

ඉඩම් කොමසාරිස් කාර්යාලය,
කොළඹ 1.
1960. 5. 14.

## ඉල්ලුම් පත්‍රය

**දෙවන ශ්‍රේණියේ ජනපද නිලධාරීන් හා ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ ඉඩම් කච්චි පරිපාලකයින් වශයෙන් පුහුණුවන්නන්ගේ තනතුරු**

1. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය :————.

*2. උපන් දින හා උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තා :————.

3. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සමර්ථවූ දින හා විෂයයන් සහිතව සහතික පිටපත් ඇමිණිය යුතුය.)

4. පාසැලින් අස්වූ දින සිට කරන ලද රක්ෂාවල් පිළිබඳ සම්පූර්ණ විස්තර සහිතව දැනට ලබන වේතනය හා වැටුප් ක්‍රමය :————.

5. කෘෂිකර්ම කටයුතු පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද :————.

6. යුද්ධ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර :————.

7. අමුණා ඇති සහතිකවල ගණන :————.

8. අයදුම්කරුගේ චරිතය පිළිබඳ දැනීමක් ඇත්තාවූ දෙදෙනකුගේ නම සහ ලිපිනයන්, ඔවුන්ගේ තනතුරුත් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* අයදුම්කරු ලංකාවෙහි ඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) හා (ඈ) දෙකම හෝ පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවෙහි නො ඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) දෙක හෝ (ඈ) දෙකම පිරවිය යුතුය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

**සුළු පරිපාලක දෙවන වර්ගයේ ඕවර්සියර් (අනියම්) තනතුරු**

වරාය කොමිෂන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ අංශයට සුළු පරිපාලක 2 ශ්‍රේණියේ ඕවර්සියර්වරුන් බඳවා ගැනීම සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1960 මැයි මස 31 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ කොළඹ වරාය කොමසාරිස් තැන වෙත එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය දිනකට රු. 2.10ක ස්ථිර වැටුපකි. රජයේ නීති රීති අනුව ජීවන වියදම් දීමනා සහ විශේෂ ජීවන වියදම් දීමනාද ගෙවනු ලැබේ.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙය පැහැදිලිවම අනියම් තනතුරක් වනවාත් හැර මේ සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් හට මෙම දෙපාර්තමේන්තුවේ තාවකාලික තරාතිරමක් හෝ ස්ථිර රැකියාවක් සඳහා අයිතිවාසිකමක් නොලැබෙනවා ඇත. තෝරා ගනු ලැබූ කාර්ය සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

**සුදුසුකම්.**—පහත දක්වෙන සුදුසුකම් සෑම අයදුම්කරුවෙකුටම ඇති බැව් පෙන්වීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960 මැයි 31 දිනට වයස අවුරුදු 25කට නොඅඩු බව හා අවුරුදු 40කට නොවැඩි බව.

(ආ) ශාරීරිකව සුදුසු බව හා යහපත් චරිතයක් ඇති බව.

(ඉ) හයවන ප්‍රමාණයෙන් සමත් වී ඇති බව.

4. **අවශ්‍ය කාර්මික සුදුසුකම්—**

(අ) කම්කරුවන් පාලනය කිරීම, කොන්ක්‍රීට් සඳහා පෙට්ටි සෑදීම, යකඩ කම්බි දමා ශක්තිමත් කරනු ලබන කොන්ක්‍රීට් වැඩ සහ විශාල කොන්ක්‍රීට් වැඩ ගැන යටත් පිරිසෙයින් අවුරුදු හතක පළපුරුද්දක් තිබිය යුතු; අතර, සාමාන්‍ය චිත්‍රකර්ම වටහා ගැනීමට හැකියාවක් තිබිය යුතුය.

(ආ) සාමාන්‍ය චිත්‍රකර්ම සැලැස්මවල් ආදිය කියවා තේරුම් ගැනීමට දැනුමක් තිබිය යුතු අතර ඒ අනුව කම්කරුවන්ට උපදෙස් දීමට හැකියාවක් තිබිය යුතුය.

(ඉ) කම්කරුවන් පාලනය කිරීමට හැකියාවක් තිබිය යුතුයි.

(ඊ) කලින් තද කරනු ලැබූ කොන්ක්‍රීට් තැනීම සහ මුහුදුබඩ වැඩ කිරීම ගැන දැනුමක් තිබීම අතිරේක සුදුසුකමක් හැටියට සලකනු ලැබේ.

5. අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්වලට පහත දක්වෙන සහතික පිටපත් අමුණා එවිය යුතුයි. (මුල් පිටපත් නොවේ.) :—

(1) උප්පැන්න සහතිකය.

(2) අධ්‍යාපන සහතිකය.

(3) කාර්මික සුදුසුකම් ඇත්නම් ඒ වෙනුවෙන් ලබා ඇති සහතික, සිවිල් ඉංජිනේරු වැඩ ගැන ලබා ඇති පළපුරුද්ද ගැන සහතික.

(4) චරිතය පිළිබඳ මෑතකදී ලබා ගත් සහතික තුනක් (මින් එකක් තමා පදිංචි කොට්ඨාශයේ ගම්මුලාදෑනියාගෙන් විය යුතුයි.)

6. මෙම තනතුරු සඳහා එවන අයදුම් පත් වරාය කොමසාරිස් තුමා, කොළඹ වරාය කොමිෂන් සභාව යන ලිපිනයට එවනවා විනා මෙහි පහත අත්සන් කර ඇති අයගේ පුද්ගලික නමට නො එවිය යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයෙහි I වෙනි කාණ්ඩයේ (II) වන ඡෙදයෙහි පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ පොදු කොන්දේසිවලට අවධානය යොමු කැරේ.

අ. න. සි. කුලසිංහ,
වරාය කොමසාරිස් තැන වෙනුවට.

මගේ අංකය : ඊ. ඇල්. 81/59 (6/ජී).
වරාය කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ.

### අයදුම් කිරීමේ ආකෘති පත්‍රය

(1) නම :————.

(2) ලිපිනය :————.

(3) වයස සහ උපන් දිනය :————.

(4) අධ්‍යාපන සුදුසුකම්—
සිංහල :————.
ඉංග්‍රීසි :————.

(5) කාර්මික සුදුසුකම් :————.

(6) සිවිල් ඉංජිනේරු වැඩ ගැන ඇති පලපුරුදුකම් :————.

(7) සහතික පත් ඉදිරිපත්කර ඇති අයගේ නාමයන් :————.

————,
අයදුම්කරුග් අත්සන.

දිනය :————.

---

## වලස්මුල්ල නානායම්පති පදවිය

වලස්මුල්ල නානායම්පති ධුරය සඳහා ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

2. **වැටුප් දීමනා :**

(අ) මෙම තනතුර සඳහා වර්ෂයකට රු. 540—12 × 22—රු. 804ක වැටුපක් හිමිය. (1 වෙනි කාර්යක්ෂමතා කඩඉම රු. 636ට ප්‍රථමද, 2 වැන්න රු. 732) තාවකාලික හා විශේෂ ජීවනා ධාරද ගෙවනු ලැබේ.

(ආ) වැටුප් හැර පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

| | | |
|---|---|---|
| (1) ඩෝබි කුලිය වර්ෂයකට | රු. | 120 කි. |
| (2) නාන කාමර පිරිසිදු කිරීමේ ගාස්තු | රු. | 60 කි. |
| (3) පැලැට් ඉදිරීමේ ගාස්තු | රු. | 90 කි. |
| (4) සීතකරය පිළිබඳ ගාස්තු | රු. | 60 කි. |
| (5) පහන් පිළිබඳ ගාස්තු | රු. | 90 කි. |
| (6) කසළ සෝධක ගාස්තු | රු. | 90 කි. |
| එකතුව | රු. | 510 කි. |

3. **වයස සීමාව :** සෑම අයදුම් කරුවෙක්ම තමා 1960.5.31 දිනට තමා අවුරුදු 25ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි වියයුතු ය.

4. **අයදුම්කරුවන්ට තිබියයුතු සුදුසුකම් :** සෑම අයදුම්කරුවෙක්ම ලාංකික විය යුතුය. කෑම පිසීම ගැන මනා දැනීමක් හා සිංහල කියවීමට හා ලිවීමටත් ඉංග්‍රීසියෙන් කථා කිරීමේ හැකියාවක් අයදුම්කරුවන් සතුවිය යුතුයි. නානායම් පාලනය පිළිබඳව පළපුරුද්දක් ඇතිවීම විශේෂ සුදුසුකමක් හැටියට සලකනු ලැබේ.

5. තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවා කොමිෂන් සභා නීති රීති, මුදල් රෙගුලාසි පාලන ව්‍යවස්ථා, නානායම් පිළිබඳ නීති, දැනට පවතින හෝ කලින් කලට පනවනු ලබන දෙපාර්තමේන්තු අණපණත් හා ආණ්ඩුව මගින් සම්මත කරන වෙනත් නීති රීති වලට යටත් වීය යුතුයි.

6. **සේවා කොන්දේසි :**

(අ) මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනාත් දරු විශ්‍රාම යෝජනා ක්‍රමයට ගෙවිය යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු තුණක් ආධුනිකත්වයේ තබනු ලැබේ.

7. අයදුම් කරුවන් සිය ඉල්ලුම් පත්‍ර වලට පහත සඳහන් ලිය කියවිලි (පිටපත්) යාකළ යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) චරිතය පිළිබඳ සහතික පිටපත් දෙකක් හා,

(ඉ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

8. නියමිත ෆෝර්මය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් කරුවන්ගේ අත් අකුරෙන් ලියන ලද අයදුම් පත් 1960 ජූනි 4 දිනට පෙර හම්බන්තොට දිසාපති තැන වෙත රෙජිස්ටර් කරනලද තැපෑලෙන් එවිය යුතුයි.

9. මේ තනතුරට පත් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් වෙතොත් එයට තමන්ගේ වියදමෙන් මෙම කාර්යාලයට පැමිණීමට අයදුම් කරුවන් සූදානම් වියයුතුයි.

10. තෝරාගනු ලබන අයදුම්කරු රු. 250ක ඇපයක් තැබිය යුතුය.

ටී. සිවඥණම්,
හම්බන්තොට දිසාපති.

1960 මැයි මස 14 වෙනි දින,
හම්බන්තොට, දිසාපති කාර්යාලයේදීය.

### ආකෘති පත්‍රය

**වලස්මුල්ල තානායම්පති ධුරය**

1. ................. දින දරණ ගැසට් නිවේදනයෙහි සඳහන් ධුරය සඳහා.

2. සම්පූර්ණ නම :————.
ජාතිය :————.

3. ලිපිනය :————.

4. අයදුම්කරු උපන් දින හා උපන් ගම :————.

5. අයදුම් කරුගේ පියා උපන් දින හා උපන් ගම :————.

6. විවාහකද අවිවාහකද යන වග :————.

7. අධ්‍යාපන සුදුසුකම් හා සමත් විභාග දිනත් සමග :————.
(අ) සිංහල.
(ආ) දෙමළ.
(ඉ) ඉංග්‍රීසි.

8. අධ්‍යාපනය ලැබූ පාසල හා පාසලෙන් අස්වූ දිනය :————.

9. (අ) පාසලෙන් අස්වූවාට පසුව නිරතවූ සේවාවන් හා විස්තර :————.
(ආ) රජයේ සේවයේ සිට අස්වූවෙක් නම් සේවය පිළිබඳ විස්තර හා අස්වීමට හේතුව :————.
(ඉ) යුද්ධ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි කථා කිරීම, කියවීම හා ලිවීම පිළිබඳ දැනුම :————.

11. විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.
(කෑම පිසීම හා පාලනය යනාදිය)

12. වෙනත් සුදුසුකම් ඇත්නම් ඒවා :————.
(තනතුර ගැන දැනීම)

13. චරිතය පිළිබඳ සහතික නිකුත් කරන මහතුන්ගේ නම් සහ තනතුරු :————.
(සහතික පිටපත් පමණක් යා කරන්න.)

14. අපරාධ නඩු පිළිබඳව වරදකරුවකු වී තිබේද? එසේ නම් දිනය, නඩු නොම්මරය හා අපරාධය පිළිබඳ විස්තර : ————.

15. ණය ගැති භාවයෙන් තුරන් අයෙක් ද? :————.

අයදුම් කරුගේ අත්සන :————.

දිනය :————.

---

### කැස්බෑව තානායමේ තානායම්කරු තනතුර

කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර 1960 ජූනි මස 20 වෙනි දින පෙරවරු 12 දක්වා භාරගනු ලැබේ.

2. වැටුප් : බඳවා ගැනීමේදී වාර්ෂික වැටුප රු. 540 කී. අවුරුදු පතා රු. 12 බැගින් වැඩිවී අවුරුදු 22 කින් රුපියල් 804 තෙක් නගී.

3. වයස් ප්‍රමාණය : අවුරුදු 25 කට නො අඩු අවුරුදු 45 කට වැඩි නොවිය යුතුයි.

4. අවශ්‍ය සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුටම ආහාර පිසීම පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුයි. සිංහල සහ දෙමළ කියවන්නට සහ ලියන්ට පුළුවන් විය යුතු අතර ඉංග්‍රීසි කථාකිරීමට දැනුමක් තිබිය යුතුයි. ගණන් තැබීමට දැනගැනීමද අවශ්‍ය සුදුසුකමකි. කෑවිලි පෙවිලි සැපයීමේ පලපුරුද්දක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. තනතුරට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :—මේ තනතුරට විශ්‍රාම වැටුප් සහිත වූවකි. තෝරාගනු ලබන අපේක්ෂකයා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සාමාජික මුදල් ගෙවිය යුතුයි.

6. සේවය පිළිබඳ කොන්දේසි :—තෝරාගනු ලබන අපේක්ෂකයා අවුරුදු 3 ක පරීක්ෂණාත්මක කාලයකට යටත්ව සේවය කළ යුතුයි. තවද පත්කරගනු ලබන්නා විසින් රු. 750 ක ඇපයක් ද තැබිය යුතුයි.

ජී. පී. නම්බයියා.
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1960 මැයි මස 16 වන දින,
කොළඹ කච්චේරියේදීය.

---

### කළුතර දිස්ත්‍රික්කයේ මොරගල තානායමේ II වැනි ශ්‍රේණියේ තානායම් භාරකාර තනතුර

**නිවැරදි කිරීමක්**

1960 මැයි මස 6 වෙනි දින අංක : 12,125 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටස, II වැනි ඡේදයේ 315 පිටේ සඳහන් කළුතර දිසාපති තැනගේ කළුතර දිස්ත්‍රික්කයේ මොනරාගල තානායමේ II වැනි ශ්‍රේණියේ තානායම් භාරකාර තනතුර සඳහා පලකොට ඇති නිවේදනයට යාකොට ඇති ආකෘති පත්‍රයේ 1 වෙනි පෙලෙහි 3වෙනි වචනය වන "මතුගම" අස්කර ඒ වෙනුවට "මොරගල"ලෙස කියවීමට යොදණු.

වී. පතිරණ,
ආණ්ඩුවේ දිසාපති.

1960 මැයි මස 12 වෙනි දින,
කළුතර කච්චේරියේ දීය.

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

2/14/8 (එච්).

### සිංහල/දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණය— 1960 ජූලි මස

**1. විභාග දිනය—**

1960 ජූලි මස 30 වැනි දින.

දෙපාර්තමේන්තු මධ්‍යස්ථානවල දී පුහුණු කරන ලද්දාවූ නිලධාරීන්ගේ ද, **මේ විභාගයට පෙනී සිටීමට කැමැති අනෙක් නිලධාරීන්ගේ ද** සිංහල/දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සහ උසස් යන පෙළවල් දෙකකින් පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය භාෂාව වන සිංහල භාෂාවේ ප්‍රවීණතාවය ලැබීම ගැන රජයෙන් පිරිනමන ප්‍රසාද මුදලට සුදුසුකම ලබනු සඳහා ආදි ප්‍රවේශක නිලධාරීන් විසින් සමර්ථ විය යුතු පරීක්ෂණය නම් 1957 මැයි මස 23 වැනි දාතමින් පිට කරන ලද අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයෙහි විස්තර කර ඇති, එමෙන් ම 1958 සැප්තැම්බර් මස 4 වැනි දාතමින් පිට කරන ලද අංක 2/9/156/1 (එච්) දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛ ලිපියෙහි සංශෝධිත වූ සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා (උසස් පෙළ) පරීක්ෂණයයි.

**2. පරීක්ෂණ මධ්‍යස්ථාන—**

පරීක්ෂණය කොළඹ හා පහත දක්වන මධ්‍යස්ථානවල පවත්වනු ලැබේ :—කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, මහනුවර, මාතලේ, නුවරඑළිය, රත්නපුරය, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, හලාවත, යාපනය, මන්නාරම, වවුනියාව, අනුරාධපුර, පොළොන්නරුව, බදුල්ල, මඩකලපුව සහ ත්‍රිකුණාමලය.

විභාගාපේක්ෂකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නැති ඕනෑම මධ්‍යස්ථානයක් අවලංගු කර දැමීමට පුළුවන.

විභාගාපේක්ෂකයන් තම තමන්ට දී තිබෙන විභාග ශාලාවට පැමිණිය යුතු ය. එය හැර අන් කිසි ම ශාලාවකට ඔවුහු ඇතුල් කරගනු නො ලැබෙති.

**3. අවශ්‍ය සුදුසුකම්—**

(i) රජයේ සේවයේ නියුක්ත (තාවකාලික නිලධාරීන් ඇතුළුව) පහත දක්වන වර්ගවලට අයත් නිලධාරීන් මේ පරීක්ෂණයට සුදුස්සෝ වෙති :—

(අ) වර්ෂයකට රු. 600 කට නො අඩු ස්ථාවර වැටුපක් ලබන අය.
(ආ) වර්ෂයකට රු. 600 කට නො අඩු මූලික පියවරක් ඇති වැටුප් ක්‍රමවල සිටින අය.

(ඇ) දෛනික වැටුපෙහි මූලික පඩි ක්‍රමය 300න් වැඩි කළ විට රු. 600 කට නො අඩුවන දෛනික වැටුප් ලබන අය.

(ii) වර්ෂයකට රු. 600 කට නො අඩු සථාවර වැටුපක් ලබන්නා වූ නැතහොත් වර්ෂයකට රු. 600 කට නො අඩු මූලික පියවරක් ඇති වැටුප් ක්‍රමයක් ලබන්නා වූ පළාත් ආණ්ඩු සේවාවේ ස්ථිර නිලධාරීහු ද මේ පරීක්ෂණයට සුදුස්සෝ වෙති.

(iii) තම නිලධාරීන්ගේ සුදුසුකම්වල හරිවැරදි බැලීම ගැන දෙපාර්තමේන්තු ප්‍රධානීහු වග කිවයුතු වෙති.

**4. අයදුම්පත්—**

(i) විභාගාපේක්ෂකයන් තම ප්‍රාදේශික කාර්යාලයේ හෝ උප කාර්යාලයේ හෝ පාඨශාලාවේ ප්‍රධාන තැන මගින් නියමිත ඇතුල් වීමේ ලැයිස්තුවල අයදුම් පත් ඉදිරිපත් කළ යුතු ය. මේ ඇතුල්වීමේ ලැයිස්තු සෑම ප්‍රාදේශික ප්‍රධාන නිලධාරියකුට ම, විභාග කොමසාරිස් තුමාගෙන් **කෙළින් ම** ඉල්ලුම් කිරීමෙන් ලබා ගත හැකිය. තම ප්‍රාදේශික කාර්යාලවලට හෝ උප කාර්යාලවලට හෝ පාඨශාලාවලට බෙදා හැරීම් පිණිස දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් ලැයිස්තු ලබා ගැනීම අනවශ්‍ය ප්‍රමාදයට හේතු වන්නක් වෙයි.

(ii) ලැයිස්තුවල යොදන නාම හා නිලතල ටයිප් කරවිය යුතු ය. පිටපත් තුනෙහි ම එක් එක් අනුක්‍රමික අංකය ඉදිරියේ ඇති නාමය වෙනස් නොවීම ඒකාන්ත කර ගනු පිණිස දෙවැනි පිටපත හා තුන් වැනි පිටපත කාබන් පිටපත් විය යුතු ය. කාර්යාලයේ ටයිප් රයිටර යක් නැතිකම නිසා, ඉහත කී අයුරින් කටයුතු කිරීම අපහසු අවස්ථාවල දී නාම හා නිලතල අතින් ලිවිම කළ හැකි ය. එහෙත් මුද්‍රණයේ දී භාවිත කරන අන්දමේ අකුරු පාවිච්චි කළ යුතු ය. අපේක්ෂකයන්ගේ නාම හා ඔවුන්ගේ නිලතල සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් දිය යුතු ය. ගුරුවරුන් සම්බන්ධයෙන් ඔවුන්ගේ නිල තල, සුදුසුකම් හා රක්ෂාවේ තරාතිරම දක්වන්නක් විය යුතු ය. **උදා :**—උපාධිලත් ගුරුවරයා, 2 වැනි ශ්‍රේණිය, විශේෂ ධුර ලත් ගුරුවරයා, ආදි වශයෙනි. ලියාපදිංචි වූ ගුරුවරයෙකු සම්බන්ධයෙන් නම් නිලයත් සමග ලියාපදිංචි කළ අංකය ද දැක්විය යුතු යි.

(iii) එක් එක් ප්‍රාදේශික ප්‍රධානයකු විසින් ලැයිස්තු අත්සන් කළ යුතු ය. ඊට පසු කල් ඇති ව රෙජිස්ටර් කවරයක බහා **දෙපාර්තමේන්තු ප්‍රධානයා** වෙත පිටපත් තුන ම ඉදිරිපත් කළ යුතුය. මෙහි දී, "ප්‍රාදේශික ප්‍රධානයා" යන්නෙන් අයදුම්කරුවා හෝ අයදුම් කරුවන් වැඩ කරන උප කාර්යාලය හෝ උප දෙපාර්තමේන්තුව හෝ පාඨශාලාව කෙළින් ම භාරව සිටින නිලධාරියා අදහස් කෙරෙයි. දෙපාර්තමේන්තුවල ප්‍රධාන කාර්යාලවල වැඩ කරන අපේක්ෂකයන් සම්බන්ධයෙන්, දෙපාර්තමේන්තු ප්‍රධාන තැන, මේ නිවේදනයේ සියලු ම කාර්යයන් උදෙසා, ප්‍රාදේශික ප්‍රධාන තැනගේ තත්ත්වය ගන්නවා ඇත. ප්‍රාදේශික ප්‍රධාන තැනගේ නිලය වහා හඳුනාගත හැකි පරිදි සටහන් කළ යුතු ය. **දෙපාර්තමේන්තු තුළ පාවිච්චි කරන නිලතල පිළිබඳ කෙටි සටහන් ක්‍රම නොයෙදිය යුතු ය.** රජයේ පාඨශාලාවලින් එවන ඇතුල්වීමේ ලැයිස්තු අධ්‍යාපන අධ්‍යක්ෂගේ නමින් නියමිත ශාඛාවට විනා අධ්‍යාපන නිලධාරි හෝ සංචාරක පරීක්ෂක මාර්ගයෙන් නො එවිය යුතු ය.

(iv) කාර්යාලයකින් හෝ ප්‍රාදේශික කාර්යාලයකින් හෝ උප කාර්යාලයකින් හෝ පාඨශාලාවකින් හෝ විභාගය සඳහා ඉදිරිපත් වන සියලු ම අපේක්ෂකයන් එකට එක ම මධ්‍යස්ථානයක දී පෙනී සිටිය යුතු ය. කිසි ම කෙනෙකුට වෙනත් මධ්‍යස්ථානයක දී පෙනී සිටීමට අවසර දෙනු නො ලැබේ.

එක් දෙපාර්තමේන්තුවකින්/ප්‍රාදේශික කාර්යාලයකින්/පාඨශාලාව කින් වෙනත් දෙපාර්තමේන්තුවකට/ප්‍රාදේශික කාර්යාලයකට/පාඨ ශාලාවකට කිසියම් අපේක්ෂකයකු මාරු කරන ලද අවස්ථාවක දී එම අපේක්ෂකයා තම දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශික කාර්යාලයේ/පාඨ ශාලාවේ ප්‍රධානයා මගින් තම නම කලින් සිටි දෙපාර්තමේන්තුවේ/ ප්‍රාදේශික කාර්යාලයේ/පාඨශාලාවේ ලැයිස්තුවෙන් තමන් දැනට සිටින දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශික කාර්යාලයේ/පාඨශාලාවේ ලැයිස්තුවට මාරු කරන ලෙස වහාම ඉල්ලා සිටිය යුතු ය. ඔහු විභාග කොමසාරිස් තුමාගෙන් තම අළුත් සූචි අංකය හා වෙනස් කළ විභාගස්ථානය සහිත අළුත් ප්‍රවේශ පත්‍රයක් (පත්‍රයක් එතකලි යෙනුත් ලැබී ඇත්නම්) ලබා ගත යුතු ය. කලින් තමාට ලැබුණු ප්‍රවේශ පත්‍රය අවලංගු වූ ද තමන් විසින් පාවිච්චි **නොකරන ලද්දා** වූ ද එකක් ලෙස සැළකිය යුතු ය. කලින් සිටි දෙපාර්තමේන්තුවට ම/ ප්‍රාදේශික කාර්යාලයට ම/පාඨශාලාවට ම දැනුදු තමන් අයිති අන්ද මින් විභාගයට පෙනී සිටීමට අපේක්ෂකයාට වුවමනා නම් ඊට තහන මක් නැත. එහෙත් එසේ කොට ප්‍රතිඵල නිකුත් වූ කල්හි ප්‍රතිඵල ලබා ගත යුත්තේ, එසේ තමන් කලින් සිටි දෙපාර්තමේන්තු ප්‍රධානයා ගෙනි.

(v) **ඇතුල්වීමේ ලැයිස්තු පිරවිය යුත්තේ එහි සඳහන් උපදේශ යන් අනුව ය. මේ උපදේශයන් පරිස්සමින් පිළිපැදිය යුතු ය.** රජයේ සේවයේ නියුක්ත වූ ද, පළාත් ආණ්ඩු සේවයේ නියුක්ත වූ ද නිලධාරීන්ගේ නාමයන් සේවය හෝ ශ්‍රේණිය හෝ පංතිය අනුව වර්ග කිරීමට කටයුතු යොදන සේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් ගෙන් සහ ප්‍රාදේශික ප්‍රධානයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ගුරුවරුන් සම්බන්ධයෙන්, නාමයන් ඔවුන්ගේ සුදුසුකම් හා රක්ෂාවේ තරා තිරම දක්වන අයුරින් වර්ග කළ යුතු ය. **උදා :**—විශේෂ ධුර ලත් ගුරුවරුන් එකට, උපාධි ලත් ගුරුවරුන් ඊළඟට, ඉක්බිතිව සහතික පත් නො ලත් ගුරුවරුන් ආදී වශයෙනි.

**(vi) මේ රෙගුලාසිවලට අනුකූල නොවන්නා වූ හෝ එහි සඳහන් උපදේශවලට අනුකූලව සූදානම් නො කරන ලද්දා වූ ඇතුල්වීමේ ලැයිස්තු ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එවැනි ප්‍රතික්ෂෙප කිරීමකින් මතුවන ප්‍රශ්නයන්ට දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ ප්‍රාදේශික ප්‍රධාන තැන වගකිවයුතු වෙයි.**

(vii) සෑම දෙපාර්තමේන්තු ප්‍රධානයෙක් ම අපේක්ෂකයන්ගේ සුදුසුකම් පිළිබඳ හරිවැරදි බලා ඇතුල්වීමේ ලැයිස්තුව (පිටපත් තුනකින්) රෙජිස්තර තැපෑලෙන් විභාග කොමසාරිස් තුමාට ඉදිරි පත් කළ යුතු ය. ලෙහෙසියෙන් හඳුනා ගැනීමට හැකි වන පරිදි ලැයිස්තු බහනු ලැබූ ලියුම් කවරයෙහි වම් පස මුදුන් කොණෙහි විභාග යෙහි නම ලිවිය යුතු ය.

(viii) ඇතුල්වීමේ ලැයිස්තු පෝරම අවශ්‍ය ප්‍රමාණයක් 1960 වේ මැයි 23 වැනි දින සිට ජූනි 2 වැනි දින දක්වා විභාග දෙපාර්තමේන්තු වෙන් ලබා ගත හැකිය. ප්‍රමාණවත් ගණනක් ලැයිස්තු නිකුත් කිරීමට විභාග දෙපාර්තමේන්තුවට ඉඩ සැලසෙන පරිදි විභාගයට පෙනී සිටීමට ඉදිරිපත් වෙතැයි සිතෙන අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව පිළිබඳ ඇනුම්දීමක් කළ යුතු ය. වැඩි පුර ඉතිරි වන ලැයිස්තු පසුව පවත්වන විභාග සඳහා ආරක්ෂා කර ගැනීම මැනවි. සම්පූර්ණ කළ සියලු ම ඇතුල්වීමේ ලැයිස්තු 1960වේ ජූනි 6 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් තුමා වෙත ලැබිය යුතු ය.

(ix) ඇතුල්වීමේ ලැයිස්තු භාර ගන්නා අවසාන දිනට පසුව විභාග කොමසාරිස් තුමා වෙත ලැබෙන ලැයිස්තු ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**5. ප්‍රවේශ පත්‍ර—**

(i) විභාග කොමසාරිස් තුමා විසින් කෙළින් ම, යොග්‍ය අන්ද මින් ප්‍රාදේශික ප්‍රධාන තැන වෙත හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන තැන වෙත ඇතුල්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපත, (අ) එක් එක් විභාගාපේක්ෂකයාට දෙන ලද සූචි අංක සහ (ආ) විභාග (ශාලා) ස්ථානය, සටහන් කොට ආපසු යවනු ඇත. මේ සමග ම ප්‍රවේශ පත්‍ර ප්‍රමාණවත් සංඛ්‍යාවක් ද අපේක්ෂකයන්ගේ හැසිරීම සම්බන්ධ නීති රීති ද යවනු ලැබේ.

ප්‍රාදේශික ප්‍රධාන තැන ඇතුල්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපතෙහි සටහන් කොට ඇති අයුරින් එක් එක් ප්‍රවේශ පත්‍රයක නම, සූචි අංකය, මධ්‍යස්ථානය සහ විභාග (ශාලා) ස්ථානය, ලියා තම අපේක්ෂකයන්ට නිකුත් කළ යුතු ය. ඇතුල් වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපතේ අපේක්ෂකයන්ට දී තිබෙන සූචි අංක, එම අපේක් ෂකයන්ගේ ප්‍රවේශ පත්‍රවල යෙදීමේ දී කිසිම වැරදීමක් සිදු නොවන සේ වග බලා ගැනීමට ප්‍රාදේශික ප්‍රධාන තැන ඉතා පරීක්ෂා කාරි විය යුතු ය. විභාග කොමසාරිස් තුමාට නොදන්වා, කිසිම අවස්ථාවක දී ප්‍රාදේශික ප්‍රධාන තැන සූචි අංකයක් වෙනස් නොකළ යුතු ය. **ඊට පසුව ප්‍රාදේශික ප්‍රධාන තැන ඇතුල්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපත රෙජිස්ටර කවරයක බහා වහා ම විභාග කොමසාරිස් තුමාට (ප්‍රතිඵල ශාඛාව) ආපසු එවිය යුතු ය. එම කවරය මුදුනෙහි විභාග යේ නම ද "ඇතුල්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපත" යන්න සඳහන් කළ යුතු ය.** ප්‍රධාන තැන මෙසේ කිරීම අතපසු කළ හොත්, ඔහුගේ නිලධාරීන්ගේ ප්‍රතිඵල ඔහුට දන්වනු නො ලැබේ.

(ii) පරීක්ෂණයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු ම තම ප්‍රවේශ පත්‍රය පරිපාලන නිලධාරි තැනට භාර දිය යුතු ය.

(iii) විභාගවල දී හැසිරිය යුතු ආකාරය ගැන විභාග කොමසාරිස් තුමා විසින් පනවා ඇති නීති රීති හා රෙගුලාසිවලින් සෑම අපේක්ෂකයෙක් ම බැඳී සිටියි. මේ නීති රීති හා රෙගුලාසි කඩ කිරීම ගැන එතුමා පනවන ඕනෑ ම දඬුවමකට ද ඔහු යටත් විය යුතු ය.

(iv) කිසියම් ප්‍රාදේශික ප්‍රධානයකුට අඩු ගණනේ විභාග දිනයට සත් දිනකට කලින් තම අපේක්ෂකයන් සඳහා ප්‍රවේශ පත්‍ර නො ලැබුණොත් අප්‍රමාදව ම ඔහු කොළඹ 2, විභාග කොමසාරිස් තුමාට ඒ බව දැන්විය යුතු යි. (විදුලි පණිවුඩ ලිපිනය : ඇක්සැම්ස්, කොළඹ).

**6. විභාග පරිපාටිය—**

විභාගය පහත දක්වන කොටස් වලින් යුක්ත වෙයි :—

(1) සිංහල—සාමාන්‍ය පෙළ
(2) සිංහල—උසස් පෙළ
(3) දෙමළ—සාමාන්‍ය පෙළ
(4) දෙමළ—උසස් පෙළ

**අපේක්ෂකයකුට පෙනීසිටිය හැක්කේ මෙයින් එක් කොටසකට පමණකි.**

(ii) සාමාන්‍ය පෙළ සඳහා අපේක්ෂා කරන දැනීම කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දැනීම වෙයි. උසස් පෙළ සඳහා පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ දැනුම අපේක්ෂා කරනු ලැබේ.

(iii) මේ විභාගයෙන් සාමාර්ථයක් ලබා ගනු සඳහා, සෑම ප්‍රශ්න පත්‍රයකින් ම එහි නියමිත ලකුණු වලින් අඩු ගණනේ සියයට 40ක් අපේක්ෂකයන් විසින් ලබාගත යුතු ය.

## නිර්දේශ පත්‍රිකාව

### සිංහල හෝ දෙමළ භාෂා

### සාමාන්‍ය පෙළ

ලකුණු

(i) භාෂාව හා රචනය පැ. 3 ක එක ප්‍රශ්න පත්‍රයයි ... 150

මේ ප්‍රශ්න පත්‍රයට පහත දක්වන කරුණු ඇතුළත් වෙයි: එනම් :—(i) වර්ණනා, දෙබස්, ලියුම් ලිවීම, කායඝ්ලයීය සටහන් හා වාර්තා, භාවාර්ත ලිවීම යන රචනා වගී එකක් හෝ වැඩි ගණනක් අඩංගු අභ්‍යාස, (ii) සරල වූ ද කලින් සූදානමක් නැත්තා වූ ද වාක්‍ය ඛණ්ඩයන්ගේ අවබෝධය පිළිබඳ ප්‍රශ්න, සහ (iii) අර්ථය, ක්‍රියාකාරක පද සම්බන්ධය, වාක්‍යාංශ සහ වාක්‍ය දෝෂ ආදී සියල්ලම හෝ සමහරක් පිළිබඳ ප්‍රශ්න.

ලකුණු

(ii) පරිවර්තනය පැ. 3 ක එක ප්‍රශ්න පත්‍රයයි ... 150

(i) සරල වාක් සම්ප්‍රදා, සරල ගද්‍ය ඛණ්ඩයක වාක්‍ය හා වාක්‍යාංශ සහ කායඝ්ලයීය ලේඛනයකින් හෝ ප්‍රවෘත්ති පත්‍ර වාර්තාවකින් උපුටා ගත් පහසු කොටසක් ඉංග්‍රිසියට සහ සිංහල/දෙමළ භාෂා වලට ද (ii) කායඝ්ලයීය ශබ්ද හා පාඨ මාලා සිංහල/දෙමළ භාෂා වලට ද පරිවර්තනය කිරීම.

### සිංහල හෝ දෙමළ භාෂා

### උසස් පෙළ

ලකුණු

(i) භාෂාව හා රචනය පැ 3 ක එක ප්‍රශ්න පත්‍රයයි ... 150

මේ ප්‍රශ්න පත්‍රයට පහත දක්වන කරුණු ඇතුළත් වෙයි: එනම් :(i) වාක්‍ය රචනාවක් (තෝරා ගැනීමට මාතෘකා කීපයක් දෙනු ඇත.) ලියුම් ලිවීම, භාවාර්ථ ලිවීම, කායඝ්ලයීය සටහන් හා වාර්තා යන රචනා වගී එකක් හෝ වැඩි ගණනක් අඩංගු අභ්‍යාස, (ii) සාරාංශයක් (කාර්යාලයීය ලේඛනයකින් හෝ ප්‍රවෘත්ති පත්‍රයක කතීඃ වාක්‍යයකින් හෝ ලිපියකින් ගද්‍ය ඛණ්ඩයක් කෙටි කර ලිවීම) සහ (iii) අර්ථය ක්‍රියා කාරක පද සම්බන්ධය, වාක්‍යාංශ සහ වාක්‍ය දෝෂ, අලංකාර, වාක්‍ය විභාගය සහ සම්බන්ධය ආදී සියල්ලම හෝ සමහරක් පිළිබඳ ප්‍රශ්න.

ලකුණු

පරිවර්තනය පැ 3 ක එක ප්‍රශ්න පත්‍රයයි ... 150

(i) වාක් සම්ප්‍රදා, ගද්‍ය හෝ පද්‍ය ඛණ්ඩයකට අයත් වාක්‍ය හා වාක්‍යාංශ, සහ කායඝ්ලයීය ලේඛනයකින් හෝ ප්‍රවෘත්ති පත්‍ර වාර්තාවකින් උපුටා ගත් කොටසක් ඉංග්‍රිසියට සහ සිංහළ/දෙමළ භාෂාවලට ද (ii) කායඝ්ලයීය ශබ්ද හා පාඨ මාලා සිංහළ/දෙමළ භාෂාවලට ද පරිවර්තනය කිරීම.

පොදු වශයෙන් කාර්යාලයීය ලිවීම් වලදී භාවිත වන පාරිභාෂික ශබ්ද හා පාඨ මාලාවන් ද රජයේ කාර්ය පරිපාටිය ද සම්බන්ධ කරුණු ගැන සැළකිල්ලක් හා අවධාරණයක් දක්වෙන සේ ප්‍රශ්න පත්‍ර පිළියෙළ කරනු ඇත.

(v) අශෝභන අත් අකුරු වලට ද අක්ෂර වින්‍යාසයේ වැරදි වලට ද ලකුණු කපනු ලැබේ.

**7. විභාගයේ කාල සටහන.—**

9—12 දහවල්—සිංහළ/දෙමළ (සාමාන්‍ය/උසස්).—භාෂාව හා රචනය.

1—4 සවස—සිංහල/දෙමළ (සාමාන්‍ය/උසස්).—පරිවර්තනය.

සෑම අපේක්ෂකයෙකුම මේ කාල සටහන මනාව සිහියේ තබා ගත යුතුයි. ප්‍රවේශ පත්‍රයත් සමග වෙනම කාල සටහනක් නිකුත් කරනු නො ලැබේ.

**8. විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු—**

දෙපාර්තමේන්තු ප්‍රධානීහු, විභාගය සඳහා තමන් විසින් අයදුම් පත් ඉදිරිපත් කරන ලදුව, තම දෙපාර්තමේන්තුවල සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට නිවාඩු දිය යුතු ය. මේ නිවාඩු රාජකාරි නිවාඩු ලෙස සැළකිය යුතු ය.

**9. ප්‍රතිඵල—**

විභාග කොමසාරිස් තුමා ඇතුල්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපත සෑම දෙපාර්තමේන්තු ප්‍රධානයකු වෙතම ඔහුගේ නිලධාරීන්ගේ ප්‍රතිඵල සහිතව ආපසු එවනු ඇත. එක එක ප්‍රශ්න පත්‍රයකින් ලැබූ සමත් අසමත්තාවය එහි ලකුණු කර තිබෙනු ඇත. සෑම දෙපාර්තමේන්තු ප්‍රධානයකු ම නොයෙක් ප්‍රාදේශීය කාර්යාල හෝ උප කාර්යාල හෝ පාඨශාලාවල නියුක්ත තම නිලධාරීන්ට ප්‍රතිඵල දන්වා යැවිය යුතු ය.

මේ සමග ම දෙපාර්තමේන්තුවේ පෞද්ගලික ලිපි ගොනුවල තැන්පත් කිරීම සඳහා, සමත් වූ අපෙක්ෂකයන්ගේ අත්සන් පෝර්ම එවනු ලැබේ. එමෙන් ම ඔවුන්ගේ චරියා සටහන්වල ද අවශ්‍ය කරුණු සටහන් කරනු ලැබේ.

පළාත් ආණ්ඩු සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් සමර්ථ වූ අයගේ අත්සන් පෝර්ම සහ ඇතුල්වීමේ ලැයිස්තුවල දෙවැනි පිටපත විභාග කොමසාරිස් තුමා විසින් පළාත් ආණ්ඩු සේවා කොමිෂන් සභාවේ සභාපති තුමා වෙත යවනු ලැබේ.

චරියා සටහන් භාණ්ඩාගාරයේ තබා ගන්නා වූ, ගණකාධිකාරි සේවය, සාමාන්‍ය ලිපිකරු සේවය, ලඝු ලේඛකයන්ගේ මාරු කළ හැකි සේවය, සරප් සේවය, ටයිප්කාර සේවය, රජයේ දිස්ත්‍රික් ලිපිකරු සේවය, අර්ධ ලිපිකාර සේවය සහ පරිවර්තක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන්, විභාග කොමසාරිස් තුමාගෙන් ප්‍රතිඵල ලැබුණු පසු සුදුසු සටහන් භාණ්ඩාගාරය විසින් ම තබනු ලැබේ.

10. විභාග කොමසාරිස් තුමාට විභාග අයදුම් පතක් ප්‍රතික්ෂෙප කිරීමට ද, අපෙක්ෂකයකුට විභාගයට ඉදිරිපත්වීම නවතාලීමට ද, කිසියම් ප්‍රතිඵලයක් නතර කර ගැනීමට ද, නැතහොත් කිසියම් ප්‍රතිඵලයක් අවලංගු කර දැමීමට ද ඕනෑ ම ප්‍රමාණවත් හේතුවක් නිසා පුළුවන. පසු ව ස්ථිර කිරීමට හෝ අවලංගු කිරීමට හැකිවන පරිදි කිසියම් අපෙක්ෂකයකුට විභාගයට පෙනී සිටීමේ තාවකාලික අවසරයක් දීමට ද පුළුවන් කම තිබේ.

11. (අ) ස්ථිර තනතුරු දරන නිලධාරීන් සම්බන්ධයෙන් **ස්ථිර නිලතල පන්ති ශ්‍රේණි හෝ සේවයෙන් උසස් කරගැනීම සඳහා ඔවුන් කරන ඉල්ලීම් සළකා බැලීමේ දී, මේ විභාගයෙන් ලැබූ සාමර්ථයක් (පෙළ දෙකෙන් ඕනෑම පෙළකින්) ඇත්නම් එය වැදගත් දෙයක් සේ ගණන් ගන්නවා ඇත.**

(ආ) තාවකාලික තනතුරු දරන නිලධාරීන් සම්බන්ධයෙන්, මේ විභාගයෙන් සමර්ථ වීම තනතුරු ස්ථිර වීමේ හිමිකමකට කරුණක් ලෙස සලකනු නොලැබේ. එමෙන් ම සිංහල භාෂාවෙන් උසස් පෙළේ විභාගයෙන් සමර්ථ වීම නිසා, 1957 මැයි මස 23 වැනි දාතමින් යුත් අංක 379 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ දැක්වෙන ප්‍රසාද දීමනාවට ද හිමිකමක් ඇති නොවේ.

12. මේ රෙගුලාසි විධිවිධාන යොදා නැති ඕනෑ ම කරුණක් සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම් තැනගේ අභිමතය පරිදි ක්‍රියා කරනු ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්,
භාණ්ඩාගාරයේ ලේකම් වෙනුවටය.

1960 මැයි මස 13 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/60/7 (ජී).

## ටයිප් ශසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1959 යේ මාර්තු

වර්‍ෂ 1960 ක්වූ මැයි මස 6 වැනි දිනය හා අංක 12,125 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, වර්‍ෂ 1960 ක්වූ අප්‍රේල් මස 27 වැනි දිනය දරණ නිවේදනය හා සම්බන්ධයි. වර්‍ෂ 1959 ක් වූ මාර්තු මස 28 වැනි දින පවත්වනු ලැබූ ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපෙක්ෂකයා ද ටයිප් ගසන්නන්ගේ සේවයට පත්කර ගැනීමට තෝරාගනු ලැබූ බැව් මෙයින් දනුම් දෙමි :—

නම : ජයකොඩි ; ජේ. ඒ. ඒ.; ලිපිනය : සහතික පත්‍ර ශාඛාව, විභාග දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2.

2. ඉහත සඳහන් අපේක්ෂකයාට පත්වීමක් වහාම දීමට ආණ්ඩුව භාරගන්නේ නැත. නමුත් ඇබෑර්තුවක් ඇති වූ විට ඔහුට පත්වීමක් දෙනුලැබේ. තුන් අවුරුදු අස්ථිර පත්වීමක් ඇතුව පත් කෙරෙනු ඇත. ඔහු විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇද්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්ෂණයකින් සාමාර්ථය ලැබිය යුතුයි. තව ද ඔහු ටයිප් ගසන්නන්ගේ සේවය පිළිබඳ කොන්දේසිවලට ද යටත් වනවා ඇත.

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්‍ෂ 1960ක්වූ මැයි මස 7 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේදීය.

---

## ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), ගෝනි රෙදි සැපයීම සඳහා 1960 ජූනි 28 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ජූනි 27 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඩූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 මැයි 20 වැනි දින,
කොළඹදීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු දිශාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් රුපියල් 20,000 සිට ඉහලට ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන් ගෙන් වර්ෂ 1960 ක්වූ ජූනි මස 7 වෙනි අඟහරුවාදා පෙරවරු 9.30 දක්වා සමලන්කුලමේ වණීවට කැඩී ගිය තැන් සෑදීමට ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. වවුනියා උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් වර්ෂ 1960 ක්වූ ජූනි මස 6 වෙනිදා දක්වා ටැන්ඩර් පත්‍ර ලබාගත හැක. තැන්පත් කලයුතු මුදල රුපියල් 25 කි.

3. තවද මෙයට උවමනා ආවුද හෝ බඩු සපයනු නොලැබේ. සිමෙන්ති පමනක් සපයනු ලැබේ.

4. ආකෘති පත්‍රවල පිලියෙල කරනලද ටැන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා එම කවරයේ වම් කෙලවරේ අසවල් වැඩ සඳහායයි විස්තර කල යුතුයි.

5. වැඩි විස්තර සඳහා උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කායර්‍යාලයෙන් විමසන්න.

6. වර්ෂ 1960 ක්වූ ජූනි මස 7 වෙනිදා පෙරවරු 9.30 ට ටැන්ඩර් ආකෘති පත්‍ර උ. දි. භාර ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් විවෘත කරනු ලැබේ.

වී. බාලසුබ්‍රමනියම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
වවුනියා උ. කො.

දිනය : 7.5.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකවැරටිය උප කොට්ඨාශයේ පාළුකඩවල ව්‍යාපාරයේ දෙවෙනි කොටස ප්‍රකෘතිමත් කිරීමේ පහත සඳහන් වැඩ සඳහා 1960 ජූනි මස 1 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

(1) ඇලවල් හැතැප්ම 7, 8 හා 9 ප්‍රකෘතිමත් කිරීම. කොන්ත්‍රාත් කරුවන් රුපියල් 10,000 ට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වී සිටිය යුතුය.

(2) ඇලවල් හැතැප්ම 10, 11 හා බෙදා හැරීමේ ඇලවල් හැතැප්ම 1, 2 හා 3 ප්‍රකෘතිමත් කිරීම. කොන්ත්‍රාත්කරුවන් රුපියල් 15,000 ට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වී සිටිය යුතුය.

(3) බිම් කට්ටි 4 හා 5 යටතේ ක්‍ෂෙත්‍ර ඇලවල් ප්‍රකෘතිමත් කිරීම. කොන්ත්‍රාත් කරුවන් රුපියල් 15,000 ට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වී සිටිය යුතුය.

(4) බිම් කට්ටි 6 යටතේ ක්‍ෂෙත්‍ර ඇලවල් ප්‍රකෘතිමත් කිරීම. කොන්ත්‍රාත්කරුවන් රුපියල් 10,000ට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වී සිටිය යුතුය.

(5) නිර්මාණ, ලෑලි හා අගුලු දැමීම් සැපයීම් හා පිළියෙළ කිරීම. කොන්ත්‍රාත්කරුවන් රුපියල් 18,000 ට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වී සිටිය යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර හා ටෙන්ඩර් ආකෘති පත්‍ර 1960 මැයි මස 30 වෙනි සඳුදා පස්වරු 4.30 වන තෙක් නිකවැරටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් විය යුතු අතර මෙම වැඩය සඳහා රුපියල් 25ක මුදලක් කච්චේරියක හෝ නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

ඇල්. බී. ඇම්. ප්‍රනාන්දු,
නිකවැරටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
නිකවැරටිය,
1960. 5. 14.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මොණරාගල වාරිමාර්ග උප කොට්ඨාශයේ හම්බෙගමුවේ අංක (2) දරණ දෙබිඩි කම්කරු නිවාසයක් සෑදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 15.6.60 වෙනි දින පෙරවරු 10 වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සමන්විත විය යුතුයි. අවශ්‍ය ෆෝරම මොණරාගල උප කොට්ඨාශ භාර වාරිමාර්ග නිලධාරීතැන ගෙන් ලබාගත හැක. තවත් වැඩි විස්තර ආදියද ඔහුගෙන්ම ලබා ගත හැකි අතර මේ සඳහා ඇති සැලසුම් ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂාකල හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 14,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පුකල හැකි හා රුපියල් 25 කච්චේරියක හෝ මොණරාගල වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල අය වළුන්ට පමණක් 14.6.60 වෙනි දිනතෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරණු ලැබේ.

ඕ. ඇස්. චන්ද්‍රරත්න,
උ. කො. භා. වා. මා. නිලධාරීතැන,
මොණරාගල වා. මා. උ. කො.

6.5.60

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මොණරාගල වාරිමාර්ග උප කොට්ඨාශයේ යුදගනාවේ අංක (2) දරණ දෙබිඩි කම්කරු නිවාසයක් සෑදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 15.6.60 වෙනි දින පෙරවරු 10 වනතෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් සමන්විත විය යුතුයි. අවශ්‍ය ෆෝරම මොණරාගල උප කොට්ඨාශ භාර වාරිමාර්ග නිලධාරි තැන ගෙන් ලබා ගත හැක. තවත් වැඩි විස්තර ආදියද ඔහුගෙන්ම ලබා ගත හැකි අතර මේ සඳහා ඇති සැලසුම් ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂාකල හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 10,500 හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පුකල හැකි හා රුපියල් 25 කච්චේරියක හෝ මොණරාගල වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරි පත් කල අය වළුන්ට පමණක් 14.6.60 වෙනි දිනතෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරණු ලැබේ.

ඕ. ඇස්. චන්ද්‍රරත්න,
උ. කො. භා. වා. මා. නිලධාරි තැන,
මොණරාගල වා. මා. උ. කො.

4.5.60.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ත්‍රිකුණාමලේ රජයේ ගොවිපලට විශූ පොල්අතු, අඹ සහ උන බම්බු සැපයීම

ත්‍රිකුණාමලේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිතැන විසින් පහත සඳහන් දේවල් ත්‍රිකුණාමලයේ රජයේ ගොවිපළට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ජූනි මස 10 වන දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

(අ) විශූ දිගින් අඩි 6කට නොඅඩු පොල් අතු 20,000ක් සැපයීම ;

(ආ) පැසුණු වල් අඹගෙඩි 10,000ක් සැපයීම ;

(ඇ) උසින් අඟල් 18කට වැඩි, විෂ්කම්භය අඟල් 5ක් ඇති යෝධ උන බම්බු 1,500ක් සැපයීම ;

(ඈ) උසින් අඟල් 12ක් සහ අඟල් 5ක් විෂ්කම්භය ඇති කහ උන බම්බු 1,500ක් සැපයීම.

2. ත්‍රිකුණාමලේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන, කෘෂිකර්ම කායර්‍යාලය, ත්‍රිකුණාමලය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "පොල් අතු/අඹ/යෝධ උන බම්බු/කහ උන බම්බු සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි. එක එක කායර්‍යයට වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර පත්‍රයක් වෙනුවෙන් රු. 10 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

6. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4 ක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු කොළඹ, ගාලුමුවදොර මහා ලේකම් කායඹාලයේ කෘෂිකම් හා ඉඩම් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

7. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී කොළඹ, ගාලු මුවදොර, මහා ලේකම් කායඹාලයේ කෘෂිකම් හා ඉඩම් අමාත්‍යාංශයේදී ඒවා විවෘත කරණු ලැබේ.

8. 1960 මැයි මස 26 දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ටද ඉඩ තිබේ.

9. නියමිත පෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ. ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉල්ලන මුදල් ගණන අකුරෙනුත් ඉලක්කමෙනුත් ලිවිය යුතුය. ඉලක්කමෙන් ලියන ලද ගණන අකුරෙන් ලියන ලද ගණනට වෙනස්වුවහොත් ටෙන්ඩරය ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

10. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කළ යුතුයි.

